// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1981/43 - 2016 අගෝස්තු මස 23 වැනි අඟහරුවාදා - 2016.08.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාව - සංශෝධන අංක 03

2014 දෙසැම්බර් මස 12 වැනි දින අංක 1892/40 හා 2014 දෙසැම්බර් මස 19 වැනි දින අංක 1893/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර මඟින් සංශෝධිත 2013 ජුනි මස 26 වැනි දින අංක 1816/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර තිබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එච්.එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2016 ජුනි මස 03 වැනි දින,

(i) 10.1 (iii) යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ:

10.1 (iii) - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ජ්‍යෝෂ්ඨත්වය හා කුසලතාවයට ලකුණු ලබාදීම මඟින් අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් බඳවා ගැනීම.

(ii) 10.1.1 යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන) තනතුරෙහි,

පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% බාහිර අයදුම්කරුවන් අතරින් පළමු පරිශිෂ්ඨයේ 2.1 (i) යටතේ සඳහන් සුදුසුකම් අනුව තරඟ විභාගයකින් සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවාගනු ලැබේ.

1A - G 24090 — 09 (2016/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25% අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් පළමු පරිශිෂ්ඨයේ 2.2 (i) යටතේ සඳහන් සුදුසුකම් අනුව සීමිත තරඟ විභාගයකින් සහ සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ සම්මුඛ පරීක්‍ෂණයක් මඟින් බඳවාගනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාවෙන් 25% අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් පළමු පරිශිෂ්ඨයේ 2.3 (i) යටතේ සඳහන් සුදුසුකම් අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු ලබාදීමේ පරිපාටියට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් මඟින් ජ්‍යෙෂ්ඨතාවයට සහ කුසලතාවයට ලබා දෙනු ලබන ලකුණු පිළිවෙල පදනම් කරගෙන බඳවාගනු ලැබේ.

එහි එක් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවන්හි එම සංඛ්‍යාව අනෙක් කණ්ඩායමෙන් බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හැකිය.

(iii) 10.1.5 (vi) යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ :

10.1.5 (vi) - අභ්‍යන්තර අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සඳහා පළමුවන පරිශිෂ්ඨයේ 2.3 හි සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර රාජ්‍ය සේවා කොමිසම මඟින් අනුමත කරනු ලබන පරිපාටියකට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවයට ලකුණු ලබා දී කුසලතා අනුපිළිවෙල හා පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් බඳවා ගනු ලැබේ.

(iv) 10.3.9 වගුවෙහි 1,4,6 යන ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කරනු ලැබේ :

10.3.9

| තනතුර | බාහිර අයදුම්කරුවන් | අභ්‍යන්තර අයදුම්කරුවන් | ආධුනිකයන් |
|---|---|---|---|
| 1. ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 30% | 20% | 50% |
| 4. කොම්පියුටර් ටයිප් සෙටර් හා මුද්‍රණ රටා සිත්තම්කරු | 30% | 30% | 40% |
| 6. මුද්‍රණ කාර්මික | | 80% | 20% |

(v) 15.4 යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

15.4 - මෙම ව්‍යවස්ථාව අනුමත වී වසර 07 ක කාලයක් දක්වා ව්‍යවස්ථාවේ නව වන ඡේදය යටතේ දැක්වෙන උත්තල මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු හා මුද්‍රණ නිමවුම්කරු යන තනතුරු සඳහා තෝරාගනු ලබන අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරෙන් මුද්‍රණ නිමවුම්කරු යන තනතුර සඳහා තෝරා ගැනීමෙන් පසු රජයේ මුද්‍රණ ආයතනය විසින් පවත්වන්නා වූ පොත් බැඳුම්කරණය පිළිබඳ මාස 06 කට නොඅඩු පාඨමාලාවකින් සමත්වීම සහ උත්තල මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් වශයෙන් තෝරා ගැනීමෙන් වසරකට පසුව ඒ සඳහා දෙපාර්තමේන්තුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්වීම ඔවුන් ස්ථිර තනතුරුවලට පත් කිරීම සඳහා ප්‍රමාණවත් වේ. තවද එම ඡේදය යටතේ ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා තෝරාගනු ලබන අභ්‍යන්තර අයදුම්කරුවන් එසේ තෝරා ගැනීමෙන් පසු රජයේ මුද්‍රණ ආයතනය විසින් පවත්වනු ලබන ලිතෝකරණය මාස 06කට නොඅඩු පාඨමාලාවකින් සමත්වීම ඔවුන් ස්ථිර තනතුරුවලට පත් කිරීම සඳහා ප්‍රමාණවත් වේ. මෙම ව්‍යවස්ථාව අනුමත වී වසර 07 කට පසුව ඉහතින් දැක්වෙන තනතුරු සඳහා බඳවා ගැනීමේදී NVQ 5 මට්ටම පැවතිය හොත් මෙම ව්‍යවස්ථාවේ 10.3 ඡේදය යටතේ දැක්වෙන විධිවිධාන අදාළ විය යුතුය.

(vi) පළමුවන පරිශිෂ්ඨයේ 2.2 යටතේ දක්වා ඇති මාතෘකාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් මාතෘකාව ආදේශ කරනු ලැබේ :

2.2 - අභ්‍යන්තර අයදුම්කරුවන් සීමිත තරඟ විභාගයකින් සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සඳහා සුදුසුකම්

(vii) පළමුවන පරිශිෂ්ඨයේ 2.3 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ :

2.3 - අභ්‍යන්තර අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සඳහා සුදුසුකම්

1. සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන)

(අ) මුද්‍රණ සේවයේ ප්‍රධාන වැඩ මූලික තනතුරක වසර 05 සක්‍රීය සේවා කාලයක් සහිතව අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(viii) පළමුවන පරිශිෂ්ඨයේ 3 (iii) යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

3 (iii) - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ වෙනත් පිළිගත් දේශීය/ජාත්‍යන්තර ආයතනයක මුද්‍රණ ශිල්පය පිළිබඳ තනතුරට අදාළව පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම

(ix) පළමුවන පරිශිෂ්ඨයේ 4.1.1 (ආ) , 4.2.1 (ආ) , 4.6.1 (ආ) යන ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

4.1.1 (ආ) පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු පලපුරුද්දක් තිබීම.

4.2.1 (ආ) පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු පලපුරුද්දක් තිබීම.

4.6.1 (ආ) පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු පලපුරුද්දක් තිබීම.

(x) පළමුවන පරිශිෂ්ඨයේ 4.1.3 යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

4.1.3 - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

(අ) දෙපාර්තමේන්තුවේ වසර 15 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මුද්‍රණ කාර්යය සහයක සේවාවේ II හෝ ඉන් ඉහල ශ්‍රේණියක නිලධාරියෙකු වීම හෝ

(ආ) දෙපාර්තමේන්තුවේ වසර 10 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මුද්‍රණ කාර්යය සහයක සේවාවේ II හෝ ඉන් ඉහල ශ්‍රේණියක නිලධාරියෙකුවීම හා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් පවත්වන්නා වූ ලිතෝකරණය පිළිබඳ පාඨමාලාවෙන් සමත්වීම.

හෝ

(ඇ) රජයේ මුද්‍රණාලයේ උත්තල මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවෙකු වශයෙන් වසර 06 ක පලපුරුද්දක් ලබා තිබීම.

(xi) පළමුවන පරිශිෂ්ඨයේ 4.1.4 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ ඃ

4.1.4 - මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේදී බාහිර අයදුම්කරුවන් අතරින් 30% ක්ද, අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් 20% ක්ද, ආධුනිකයන් අතරින් 50% ක් ද වශයෙන් අනුපාතයක් සහිතව බඳවා ගනු ලැබේ. එසේ වුවද යම් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොසිටින අවස්ථාවකදී එම සංඛ්‍යාව අනෙක් කණ්ඩායමෙන් බඳවා ගැනීමට රජයේ මුද්‍රණාලයාධිපතිට හැකිවේ.

(xii) පළමුවන පරිශිෂ්ඨයේ 4.2.2 යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

4.2.2 - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

(අ) දෙපාර්තමේන්තුවේ වසර පහළොවකට (15) නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මුද්‍රණ කාර්ය සහයක සේවාවේ II හෝ ඉන් ඉහළ ශ්‍රේණියක නිලධාරියෙකු වීම.

(xiii) පළමුවන පරිශිෂ්ඨයේ 4.5.1 යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

4.5.1 - බාහිර අයදුම්කරුවන් සඳහා

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය, සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා අතුරින් මාධ්‍ය භාෂාව, විද්‍යාව ඇතුළුව විෂයයන් හතරකට (04) අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත්වීම.

(ආ) පුහුණුවීම් කාලයත් සමග පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර පහකට (05) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(ඇ) ක්ෂේත්‍රයට අදාළව NVQ 4 මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

(xiv) පළමුවන පරිශිෂ්ඨයේ 4.5.2 යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ:

4.5.2 - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය, සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව අවම වශයෙන් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම ;

(ආ) (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී, සිංහල/දෙමළ භාෂාව සහිතව සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත් වී තිබීම ප්‍රමාණවත් වේ.) ;

(ii) (ආ) (i) හි සඳහන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී , ඉංග්‍රීසි භාෂාව විෂයය සමත්ව නොතිබෙන අවස්ථාවක එම විෂයය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී කුමන අවස්ථාවකදී හෝ ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(xv) පළමුවන පරිශිෂ්ඨයේ 4.5.3 යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

4.5.3 - ආධුනිකයින් සඳහා

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය, සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව ඇතුළුව විෂයයන් හතර (04) කට අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හය (06) කින් සමත්වීම ;

(ආ) (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී, සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත් වී තිබීම ප්‍රමාණවත් වේ.) ;

(ii) (ආ) (i) හි සඳහන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී , සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාව විෂයය සමත්ව නොතිබෙන අවස්ථාවක එම විෂයයන් සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී කුමන අවස්ථාවක දී හෝ ඒ ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබීම.

(xvi) පළමුවන පරිශිෂ්ඨයේ 4.5.4 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ :

4.5.4 - මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේදී බාහිර අයදුම්කරුවන් අතුරින් 30% ක්ද, අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරින් 30% ක් ද ආධුනිකයින් අතුරින් 40% ක්ද වශයෙන් අනුපාතයක් සහිතව බඳවාගනු ලැබේ. එසේ වුවද යම් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොසිටින අවස්ථාවකදී එම සංඛ්‍යාව වෙනත් කණ්ඩායමකින් බඳවා ගැනීමට රජයේ මුද්‍රණාලයාධිපතිට හැකිවේ.

(xvii) පළමුවන පරිශිෂ්ඨයේ 4.6.2 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ :

4.6.2 (ආ) - දෙපාර්තමේන්තුවේ වසර 10කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මුද්‍රණ කාර්යය සහයක සේවාවේ II ශ්‍රේණියේ හෝ ඉන් ඉහල නිලධාරියෙකු වීම හා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ හෝ පිළිගත් ආයතනයක පොත් බැඳුම්කරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

(xviii) පළමුවන පරිශිෂ්ඨයේ 4.7.2 යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

4.7.2 - ආධුනිකයින් සඳහා

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය, සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි යන භාෂා අතරින් මාධ්‍ය භාෂාව ඇතුළුව විෂයයන් හතර (04) කට අවම වශයෙන් සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හය (06) කින් සමත්වීම ;

(ආ) (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී, සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුන (03) කින් එකවර සමත්වීම ප්‍රමාණවත් වේ.) ;

(xix) පළමුවන පරිශිෂ්ඨයේ 4.7.3 යටතේ පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ :

4.7.3

(අ) මෙම අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරෙන් 80% ක්ද, ආධුනිකයින් අතුරෙන් 20% ක් ද වශයෙන් අනුපාතයක් සහිතව බඳවා ගනු ලැබේ. එසේ වුවද යම් කණ්ඩායමකින් ප්‍රමාණවත් සුදුසුකම් සහිතව අයදුම්කරුවන් නොසිටින අවස්ථාවකදී එම සංඛ්‍යාව වෙනත් කණ්ඩායමකින් බඳවා ගැනීමට රජයේ මුද්‍රණාලයාධිපතිට හැකිවේ.

(ආ) මෙම තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් තෝරා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රථිපල මත සිදු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ව්‍යවස්ථාවේ 10.3.8 වගන්තියේ සඳහන් විධිවිධාන අදාළ වේ.

(xx) පළමුවන පරිශිෂ්ඨයේ 5 වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

5 - ඉහත 4.1.1.(ආ) , 4.2.1 (ආ) 4.6.1 (ආ) වගන්තිවල සඳහන් පස් අවුරුදු සේවා කාලය තුළ අයදුම්කරුවන් සේවය සඳහා අර්ථසාධක අරමුදලට / විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවා තිබෙන බවට සනාථ කළ යුතුය.

(xxi) 10.2.6 යන ඡේදය ඉවත් කරනු ලැබේ.

(xxii) 10.3.14 (iv) යන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ.

ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) පරීක්‍ෂණවලදී නියමිත ප්‍රවීණතාව ලබා ගන්නා අයදුම්කරුවන් වෙත අදළ ප්‍රවීණතා සහතික ලබා දෙනු ලැබේ.

09 - 284

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.